# අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය

**සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා/ අධිකරණ සෝෂක හා ප්‍රවේශක III ශ්‍රේණිය සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම - 2024**

1.0 අංක PSC/EST/06-01-32/01/2016 දරණ 2016.07.26 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද බඳවා ගැනීමේ පටිපාටියේ 08 ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා/ අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුරු සඳහා III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය විසින් **2024 දෙසැම්බර් මස කොළඹ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0. විභාගය සඳහා පෙනී සිටීමට සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා/ අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුරේ III ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධරයකු විය යුතුය.

3.0 අපේක්ෂිත අයදුම්කරුවන් විසින් මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියට පිවිස www.moj.gov.lk නිසි පරිදි සම්පූර්ණ කරන ලද අදාල අයදුම්පත් 2024.11.17 දින හෝ ඊට පෙර මාර්ගගත ක්‍රමයට යොමු කළ යුතු වේ.

4.0 මේ සඳහා අයදුම්පත්‍ර 2024.10.24 දින සිට 2024.11.17 දින දක්වා මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පල කරනු ලැබේ.

5.0 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරීන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් සම්පූර්ණ කල යුතුය.

6.0 අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු අතර, තොරතුරු සම්පූර්ණ නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.0. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය ඉදිරිපත් කිරීමෙන් ස්වකීය අනන්‍යතාවය සනාථ කල යුතුය.

8.0. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට අයදුම්කරුවන් යටත් වන අතර, ව්‍යාජ තොරතුරු සපයා ඇති හෝ මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි අතර, අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු / ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

9.0 පළමුවන වරට මෙම විභාගයට අයදුම්කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ.

9.1 එතකුදු වුවත්, ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් අදාළ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 600/-ක මුදලක් විභාග ගාස්තු වශයෙන් අධිකරණ අමාත්‍යාංශයේ කොළඹ 12, මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176100199025184 ට බැර වන ලෙස මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා රිසිට්පතෙහි ස්කෑන් කර ලබා ගත් මෘදු පිටපත, මාර්ගගතව යොමු කරනු ලබන අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇමිණිය යුතුය (upload කළ යුතුය).

<u>සැ.යු.</u> : ඉහත පරිදි විභාග ගාස්තු නොගෙවන අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු නොලැබේ. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලබන අතර, එම ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

10.0 මෙම විභාගය සිංහල සහ දෙමළ භාෂාවලින් පැවැත්වේ.ඒ අනුව,විභාග අපේක්ෂකයන්ට එම භාෂා අතුරින් කවර හෝ භාෂා මාධ්‍යයකින් මෙම විභාගයට පෙනී සිටිය හැක. විභාගය සඳහා අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11.0 ප්‍රවේශ පත්‍ර ලැබූ නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. විභාගයට පෙනී සිටීම සඳහා ගමන් කිරීම වෙනුවෙන් ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

12.0 උක්ත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අදාළ විභාග පරිපාටිය සහ විෂය නිර්දේශය පහත පරිදි වේ (වැඩි විස්තර සඳහා සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා/ අධිකරණ සෝෂක හා ප්‍රවේශක සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ 8 ඡේදය බලන්න).

12.1 පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

විභාග පරිපාටිය
අයදුම්කරුවන් පහත දැක්වෙන විෂය නිර්දේශයේ ඇතුළත් බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

සාමර්ථය සඳහා විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ක් ලබා ගත යුතුවේ.

| **විෂයය** | **ලකුණු** | **කාලය** |
|---|---|---|
| කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා ගිණුම් ක්‍රම | 100 යි | පැය 01 |

විෂය නිර්දේශය

**කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා ගිණුම් ක්‍රම**

කාර්යාල ක්‍රම වල වැදගත්කම, කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, ලැබෙන ලියුම් හා පිටතට යැවෙන ලියුම් පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග, ලිපි ගොනුවල සටහන් ලිවීම, වාර්තා ලිවීම, මහජනයා සමඟ කටයුතු කිරීම පිළිබඳ අවබෝධය

ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ පරිච්ඡේද අංක XII, XXIV

මුදල් රෙගුලාසි සංග්‍රහයේ III පරිච්ඡේදය-මු.රෙ 124-127

13.0 විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ඇත.

14.0 සිංහල, හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැලකිය යුතුය. මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධව මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.

15.0 මේ පිළිබඳ යම් කිසි ගැටලුවක් පවතින්නේ නම් හෝ පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම්, අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනයේ දුරකථන අංක 011-2076204 ඇමතිය හැක.